කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
නීති පීඨය

# නීතිවේදී උපාධි පරීක්ෂණය, දෙවන වසර - 2022

## සාධාරණත්වය හා භාර නීතිය

(පැ තුනයි)

**මුළු ප්‍රශ්න ගණන : 06**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

*(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)*

---

1. 'යුක්තිය ඉටුකර ගැනීම නීතියේ සහ සාධාරණත්වයේ පරම අභිමතාර්ථයයි. කෙසේ වෙතත්, ප්‍රායෝගිකව, නීතියේ ස්වභාවය රළු, අනම්‍යශීලී සහ අයුක්තිසහගත වන විට යුක්තිය සාක්ෂාත් කර ගැනීම සඳහා සාධාරණත්වයේ ප්‍රවේශය නීතියෙන් වෙනස් වේ. නීතියේ සම්මුති විරහිත ස්වභාවය සමහර විටෙක නීතිය නිර්මාණය මගින් අපේක්ෂිත යුක්තිය ඉටු කර ගැනීමට අසමත් වීම වෙත යොමු කරයි.'

   ඉංග්‍රීසි නීතියෙහි සාධාරණත්වයේ ප්‍රගතිය ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

   **(ලකුණු 100)**

2. (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

   (අ). හොරයිසන් සමාජ ශාලාව (Club Horizon) 2016 වසරේ සිට වික්ටෝරියා ජලාශයේ මෝටර් බෝට්ටු ධාවන තරඟ සහ ජලය මත ලිස්සා යාමේ තරඟ පැවැත්වීමේ නිරතව සිටියි. පරිචයක් ලෙස සමාජ ශාලාව විසින් ඉහත ක්‍රියාකාරකම් සඳහා යොදාගනු ලැබුවේ කුඩා බෝට්ටු පමණි. 2021 දී ක්ලිෆර්ඩ් තම පවුලේ අය සමඟ වික්ටෝරියා ජලාශය අසල ඉදිකරන ලද නිවසකට පදිංචියට ගියේය. ඔහු පදිංචි වී දින කිහිපයකට පසු, සමාජ ශාලාවේ ක්‍රියාකාරකම් වලින් නිකුත් වන ඝෝෂාව දරාගත නොහැකි මට්ටමක පවතින බව ඔහුට හැඟී ගියේය. සමාජ ශාලාව විසින් ජාත්‍යන්තර තරඟාවලි සඳහා සහභාගී වීමට විශාල අධිබල

අනෙක් පිටුව බලන්න.

බෝට්ටු භාවිතා කළ අතර ඒ හේතුවෙන් ඝෝෂාකාරී පුහුණුවීම් හට ගැනිණි. ක්ලිෆර්ඩ්, සමාජශාලාවේ ක්‍රියාකාරකම්වල ඝෝෂාව නිසා දැඩි අපහසුතාවයට පත් වූ අතර ශබ්දය හේතුවෙන් ඔහුට මාර්ගගත ජාත්‍යන්තර ව්‍යාපාරික රැස්වීම් කිහිපයක් ද අවලංගු කිරීමට සිදුවිය. සමාජ ශාලාවේ ඝෝෂාකාරී ක්‍රියාකාරකම් හේතුවෙන් සාමකාමී පරිසරයකට ඇති අයිතිය සහ, සතුටින් හා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ඇති අයිතිය උල්ලංඝනය වන බවට ඔහු චෝදනා කරයි.

ඔහුට ලබා ගත හැකි සාධාරණත්ව ප්‍රතිකර්ම ඇසුරින් ක්ලිෆර්ඩ්ට උපදෙස් දෙන්න.

(ආ). 2021 දී මෙසී ඉතාලි ආහාර අලෙවිසැල් (Messy Italian Food Outlet) විසින් අදාළ ගොඩනැගිල්ලේ හිමිකරු වන මයිකල් සමඟ වසර 05ක කාලයක් සඳහා බදු ගිවිසුමකට එළඹිණි. ප්‍රධාන වශයෙන්ම රටේ පවතින වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපාරයෙන් විශාල ආදායමක් අහිමි වීම නිසා 2022 දී ඉතාලි ආහාර අලෙවිසැල විසින් ආහාර අලෙවිසැල වසා දැමීමට තීරණය කළේය. ඉතාලි ආහාර අලෙවිසැල විසින් බදු ගිවිසුම අවසන් කිරීමට තීරණය කළ අතර මයිකල්ගෙන් ශේෂ මුදල් නැවත ඉල්ලා සිටියේය. මයිකල් තර්ක කරන්නේ මෙම අලෙවි සැළ වසා දැමීම හේතුවෙන් බදු ගිවිසුමේ නියමයන් උල්ලංඝනය වන බවත්, බදු ගිවිසුමේ ඉතිරි කාලය ඇතුළත ගිවිසුම එපරිද්දෙන්ම ඉටු කිරීම සිදු කළ යුතු බවත්ය. ගිවිසුම අවසන් කිරීමට අදාළ කිසිදු වගන්තියක් එම බදු ගිවිසුමෙහි අඩංගු නොවේ. ඉතාලි ආහාර අලෙවිසැල ඔබගේ උපදෙස් පතයි.

සාධාරණත්ව ප්‍රතිකර්මවලට අදාළ මූලධර්ම ඇසුරින් ඉතාලි ආහාර අලෙවිසැලට උපදෙස් දෙන්න.

**(ලකුණු 50 x 2 = 100)**

**අනෙක් පිටුව බලන්න.**

3. (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ). 'වලංගු භාරයක් පිහිටුවීම සඳහා එහි නිර්මාතෘ විසින් නෛතික අවශ්‍යතා පිළිබඳව නිශ්චිතභාවයකින් පසු වීම, ප්‍රකාශිත භාරයක අවශ්‍යතාවයකි. එවැනි නිර්ණායක සපුරාලීමට අපොහොසත් වීමෙන් අවලංගු භාරයක් ජනිත වනු ඇත.'

භාර ආඥා පනතේ විධිවිධාන ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 60)

(ආ). ගාමිණී තම නිවස සහ මෝටර් රථය ඔහුගේ දියණිය වන රන්දිට දායාද කිරීමට අපේක්ෂා කළේය. ගාමිණීගේ මරණයෙන් පසු රන්දිට දේපළ පැවරීමේ වාචික ගිවිසුමක් මත ගාමිණී මෙම දේපළ තම මිතුරු රනිල්ට පවරා දුන්නේය. ගාමිණීගේ මරණයෙන් පසු රන්දිට දේපළ පැවරීම රනිල් ප්‍රතික්ෂේප කරයි.

දී ඇති සිදුවීම් පෙළ තුළ වලංගු භාරයක් නිර්මාණය වී ඇත්ද යන්න භාර ආඥාපනතේ අදාළ නෛතික ප්‍රතිපාදන උපුටා දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 40)

4. (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ). පැරඩයිස් සංචාරක නියෝජිතායතනය (Paradise Travel Agency -PTA), යුරෝ ගුවන් සමාගමෙහි නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරයි. PTA විසින් ගුවන් සමාගමේ ටිකට්පත් විකුණා, එම ටිකට්පත් විකිණීමෙන් ලැබෙන මුදල් තබා ගනී. PTA මූල්‍ය දුෂ්කරතාවලට ගොදුරු වූ අතර එහි කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා ගුවන් සමාගමේ ටිකට්පත් විකුණූ මුදල් භාවිතා කළේය. පසුව PTA විසින් ටිකට්පත් විකුණූ මුදල් යුරෝ ගුවන් සමාගම වෙත පැවරීම ප්‍රතික්ෂේප කළේය. අදාළ වැටුප් ගෙවීම සඳහා ටිකට් මුදල් භාවිතා කිරීමට බලය ලබා දුන් PTA හි අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නඩු පැවරීමට යුරෝ ගුවන් සමාගම අදහස් කරයි.

භාර ආඥා පනතේ විධිවිධාන ඇසුරින් යුරෝ ගුවන් සමාගමට උපදෙස් දෙන්න.

අනෙක් පිටුව බලන්න.

(ආ). ඉක්විපොර් (Equipore) යනු ඉන්දියන් සාගරයේ පිහිටි දූපත් රාජ්‍යයකි. Equipore හි, අක්කර 99ක තේ වත්තකට එරික් හිමිකම් කියන අතර තවත් අක්කර තිහක තේ වත්තක් මිලදී ගැනීමට ඔහුට අවශ්‍ය විය. කෙසේ වෙතත්, අක්කර 100 ක සීමාවට ළඟා වූ පසු, තේ වතු මිලදී ගැනීම පාලනය කිරීම සඳහා වන රජයේ රෙගුලාසි අදාළ වේ. මෙම රෙගුලාසි මග හැරීම සඳහා එරික් ඔහුගේ දියණිය ලිලීගේ නමින් අක්කර තිහක තේ වත්තක් මිලදී ගත්තේය. කෙසේ නමුදු, එම අක්කර තිහක තේ වත්තේ භුක්තිය එරික් සතු විය. එරික් අක්කර තිහේ තේ වත්ත විකුණා වෙනත් ආයෝජනයක් සඳහා මුදල් ලබා ගැනීමට අපේක්ෂා කරයි. නමුත්, ලිලී කියා සිටින්නේ අක්කර තිහේ තේ වත්තේ හිමිකරු ඇය බවත්, එරික්ට ඇගේ දේපළ විකිණීමට අයිතියක් නොමැති බවත්ය.

Equipore හි භාර ආඥාපනත ශ්‍රී ලංකාවේ භාර ආඥාපනතට සමාන යැයි උපකල්පනය කරන්න. භාර ආඥා පනතේ විධිවිධාන අනුව එරික්ට උපදෙස් දෙන්න.

**(ලකුණු 50 x 2 = 100)**

5. චන්ද්‍රා හොස්පිටල්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි විශ්‍රාමික අධ්‍යක්ෂවරයෙකු වන වෛද්‍ය චන්ද්‍රා, ඔහුගේ අන්තිම කැමති පත්‍රයෙන් පහත සඳහන් දෑ පිහිටුවීමට අපේක්ෂා කළේය.

(අ) පීඨයේ අවශ්‍යතා සහිත සිසුන් අතරේ මුදල් බෙදා දීමට TAMSAI වෛද්‍ය පීඨයේ රෙජිස්ට්‍රාර්වරයාට රුපියල් මිලියන 2ක්;

(ආ) චන්ද්‍රා හොස්පිටල්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි කාර්ය මණ්ඩලයේ දරුවන්ට අධ්‍යාපන පහසුකම් ලබාදීමට රුපියල් මිලියන 10ක්;

(ඇ) වඳුරු උණ (Monkey Pox) නම් රෝගයට එරෙහිව එන්නතක් සොයා ගැනීමට පර්යේෂණ කිරීමට රුපියල් මිලියන 15ක්;

99 x → (ඈ) අශ්වයන් නඩත්තු කිරීම සඳහා නුවරඑළිය ග්‍රෙගරි අශ්ව ඉස්තාලයට රුපියල් මිලියනයක්;

(ඉ) චන්ද්‍රා රෝහලේ උද්‍යානයේ වෛද්‍ය චන්ද්‍රා වෙනුවෙන් ස්මාරකයක් ඉදිකිරීමට රුපියල් 500,000ක්.

වෛද්‍ය චන්ද්‍රාගේ අන්තිම කැමති පත්‍රයෙහි ඉහත සඳහන් දායාද කිරීම මගින් වලංගු පුණ්‍ය භාරයක් නිර්මාණය කරන්නේද යන්න සාකච්ඡා කරන්න.

**(ලකුණු 20 x 5 = 100)**

අනෙක් පිටුව බලන්න.

6. බාලාට මහනුවරින් නිවසක්, බදුල්ලේ තේ වත්තක්, යාපනයේ අක්කර තුනක ඉඩමක්, සහ කොළඹ මහල් නිවාස දෙකක් හිමිය. බාලාට කවිතා, විමලා යන දියණියන් දෙදෙනකු සහ කුමාර් නම් පුතෙකු විය. පහත සඳහන් දේපල සඳහා ඔහු නිවිලන් සහ රාජා භාරකරුවන් ලෙස පත් කළේය.

- ඔහුගේ සහෝදරියගේ පුතා සමඟ විවාහ වුවහොත් ත්‍යාගයක් ලෙස බාලාගේ මහනුවර පිහිටි නිවස කවිතාගේ විවාහයේදී ඇයට පැවරීමට නියමිතය. ඇය ඔහු සමඟ විවාහ වීමට අපොහොසත් වුවහොත් නිවස විකුණා එම මුදල් දරුවන් තිදෙනාට සමානව බෙදා දීමට;
- තේ වත්ත විකුණා එම මුදල් විමලාගේ නමට ඇයගේ අර්ථලාභය පිණිස ස්ථාවර තැන්පතුවක තැන්පත් කිරීමට;
- කුමාර්ට වයස අවුරුදු දහඅට පිරෙන විට බාලාගේ අක්කර තුනක ඉඩම විකුණා එම මුදල දරුවන් තිදෙනාට සමව බෙදා දීමට;
- බාලාගේ මහල් නිවාස කුලියට දීමටත් එම කුලිය දරුවන්ට ප්‍රයෝජනවත් වන ආයෝජන සඳහා යෙදවීමටත් නියමිතය.

කවිතා තම පාසල් මිතුරෙකු සමඟ සම්බන්ධතාවයක් පවත්වා ඔහු සමඟ විවාහ විය. කවිතා මහනුවර නිවස ඇගේ නමට පවරා ගත්තේ භාරකරුවන්ට කොමිස් මුදලක් ගෙවීමෙනි. තේ වත්ත නිවිලන් සහ රාජා විසින් විකුණා ඇති අතර, එම මුදල් නිවිලන්ගේ සහ රාජාගේ නමින් ඒකාබද්ධ ගිණුමක තැන්පත් කර ඇත. කවිතා, කුමාර් සහ විමලා වයස අවුරුදු දහඅට සම්පූර්ණ කර ඇති අතර, අක්කර තුනක ඉඩම විකිණීමෙන් තොරව එය ඔවුන්ගේ නමට සමානව පවරා ගැනීමට ඔවුහු බලාපොරොත්තු වෙති. කවිතා, කුමාර්, විමලා සහ රාජාගේ දැනුමකින් තොරව නිවිලන් විසින් ඔහුගේ නමට නිවසක් මිලදී ගැනීම සඳහා බාලාගේ මහල් නිවාසවලින් ලැබුණු කුලී මුදල් යොදාගෙන ඇත.

ඉහත තත්ත්වයන් තුළ ඇති නීතිමය ගැටලු සාකච්ඡා කරමින්, භාර ආඥාපනතේ විධිවිධාන ඇසුරින් ඔවුන්ගේ නෛතික යුතුකම් සහ අයිතිවාසිකම් පිළිබඳව පාර්ශ්වයන්ට උපදෙස් දෙන්න.

**(ලකුණු 100)**

************